041-2281212

124


ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

නො.07, ග්‍රෙගරි මාවත, කොළඹ 07.
இல 7, கிரகறிஸ் மாவத்தை, கொழும்பு 07.
No 07, Gregory's Avenue, Clombo 07.

ෆැක්ස් / பெக்ஸ் / Fax : 2684051
ඊමේල් / ஈ-மெயில / E-mail : Landcom@sltnet.lk


මගේ අංකය / எனது இல. / MY NO : චක්‍රලේඛ අංක 2007/3 (iii)
ඔබේ අංකය / உமது இல. / YOUR NO :
දිනය / திகதி / DATE : 2008.07. 16

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්

නියෝජ්‍ය / සහකාර ඉඩම් කොමසාරිස්වරුන් (අන්තර් පළාත්)

**<u>ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කර ඇති</u>**

**<u>ප්‍රදාන පත්‍ර වල පසු කටයුතු</u>**

ඉහත කරුණ සම්බන්ධ චක්‍රලේඛ අංක 2007/3 ට ඔබගේ අවධානය යොමු කරවමි. එම චක්‍රලේඛයේ VI කොටස ලෙස පහත සඳහන් උපදෙස් මෙම චක්‍රලේඛය මගින් හඳුන්වා දීමට තීරණය කර ඇති බව කාරුණිකව දන්වමි.

VI කොටස

<u>ප්‍රදාන පත්‍ර වල අයිතිය රජයට භාරදීම</u>

ප්‍රදාන පත්‍ර කරුට ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ප්‍රදානය ලැබාගත් පරමාර්ථ වලට පරිබාහිර වෙනත් කාරණා සඳහා ඉඩම යෙදවීමට ඇති අවශ්‍යතා පිළිබඳ ඉල්ලීමද වැඩි වෙමින් පවතින බව ප්‍රාදේශීය ලේකම්වරුන් එවා ඇති නිරීක්ෂණ වලින් පෙනී ගොස් ඇත.

මෙම ඉල්ලීම් අතර විවිධ සංවර්ධන අවශ්‍යතා සඳහා සිය කැමැත්තෙන් ඉඩම රජයට භාරදීම, තමන් පදිංචි ප්‍රදේශයේ දියුණුව උදෙසා පොදු අවශ්‍යතාවයන්ට පරිත්‍යාග කිරීම, ආගමික කටයුතු සඳහා පරිත්‍යාග කිරීම, දුරකථන පහසුකම්, විදුලිය පහසුකම් ලබා ගැනීම වැනි ග්‍රාමීය ප්‍රදේශ වල සිදුවන සංවර්ධන ක්‍රියාකාරකම් උදෙසා ඉඩම ලබා දීම වැනි කරුණු දැනට දක්නට ලැබේ.මෙවැනි අවශ්‍යතාවයන් සඳහා යම් ප්‍රදාන පත්‍ර කරුවෙකු සිය ඉඩමෙන් කොටසක් යෙදවීමට කැමති අවස්ථාවක ඒ පිළිබඳව පහත සඳහන් පියවර ගත හැකිය.

(i) අදාල ප්‍රදාන පත්‍රය ප්‍රදානපත්‍ර කරුගේ කැමැත්ත මත ආපසු රජයට භාර ගැනීම.
(ඇමුණුම 14 ආකෘතිය පිටපත් 3 ක්)

(ii) ඇමුණුම 14 ආකෘතියේ එක් පිටපතක් සමග අදාල ප්‍රදාන පත්‍රය හා එහි කාර්යාල පිටපත අදාල පරිදි පළාත් ඉඩම් කොමසාරිස් මගින් මා වෙත එවන්න.

(iii) දීමනාපත්‍රය අවලංගු කල බව දැන් වූ පසු එම දීමනාපත්‍රයේ ලියාපදිංචිය අවලංගු කිරීමට ලියාපදිංචි කර තිබුනේ නම් පමණක් කටයුතු කරන්න.ඒ සඳහා කලින් සකස් කල ඇමනුම 14 ආකෘතිය පිටපත් 3 යොදා ගන්න.

(iv) දීමනාපත්‍රයේ ලියාපදිංචිය අවලංගු කල පසු ඉඩම මැන රජයට ආපසු ලබා දෙන ඉඩම කොටස් හැර ප්‍රදාන කරු තබා ගන්නා ඉඩම කොටස සඳහා නව පිඹුරක් යටතේ නව රේඛා චිත්‍රයක් ගෙන්වාගෙන පැරණි ප්‍රදාන පත්‍ර අංකය යටතේ ප්‍රදාන පත්‍රයක් පිළියෙල කල හැකිය.

(v) රජයට භාරගත් ඉඩම කොටය අදාල කාර්යට යෙදවීම සඳහා සුදුසු පරිදි පියවර ගන්න.

එස්. ඩී. ඒ. බී. බොරලැස්ස
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත්:-

01. ලේකම් , ඉඩම හා ඉඩම සංවර්ධන අමාත්‍ය - දැ.ගැ.ස.
02. ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - දැ.ගැ.ස.
03. රෙජිස්ට්‍රාර් ජනරාල් - දැ.ගැ.ස.- ඔබගේ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වරුන් වෙත යැවීම සඳහා මෙ සමග පිටපත් එවා ඇත.
04. සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් - දැ.ගැ.ස.
05. සියලුම පළාත් ඉඩම කොමසාරිස්වරුන් - දැ.ගැ.ස.

ඇමුණුම 14

ප්‍රදාන පත්‍රයක ඉඩම කොටසක් ආපසු රජයට භාරදීම.

ඉඩම හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්,

## 1969 අංක 16 දරන පනතේ හා 1981 අංක 27 දරන ඉඩම් සංවර්ධන (සංශෝධිත) පනතින් ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රයට ඇතුලත් ඉඩම/ඉඩමෙන් කොටසක් රජයට භාරදීම.

.................................... පළාත් සභාවේ .................................... ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ............................................................................ ලිපිනයේ පදිංචි ............................................ වන මම 1969 අංක 16 දරණ පනතින් හා 1981 අංක 27 දරණ ඉඩම සංවර්ධන (සංශෝධිත) පනතින් සංශෝධිත (464 වන අධිකාරිය වූ) ඉඩම සංවර්ධන ආඥා පනතේ විධි විධාන වලට අනුකූලව නිකුත් කරන ලද පහත උපලේඛනයේ විස්තර කෙරෙන අංක ........................ දරණ ප්‍රදාන පත්‍රයේ ප්‍රදානලාභී ............................................................................ ලෙස එකී ප්‍රදානය කරන ලද මා වෙත ලැබුන සම්පූර්ණ ඉඩම / ඉඩමෙන් කොටසක් සඳහා මගේ සියලුම අයිතිවාසිකම්, පොලමකාර අයිතිවාසිකම් අද දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට පෙරලා ආපසු භාර දෙමි.

.................................

ප්‍රදාන කරුගේ අත්සන

ඉහත කී ප්‍රදාන පත්‍රය අද දින ආපසු භාර ගනිමි.

.................................

ප්‍රා.ලේ / නිඉකො / සඉකො (අවසර පළාත්) අත්සන

එකී ඉඩමේ උප ලේඛනය

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

| | | |
|---|---|---|
| ප්‍රදාන පත්‍ර අංකය | පෙර ලියාපදිංචි අංකය | ලියාපදිංචි කල දිනය |
| .............................. | .............................. | .............................. |

ප්‍රදාන

ඇමුණුම 14

> ප්‍රදාන පත්‍රයක ඉඩම් කොටසක් ආපසු රජයට භාරදීම.

ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්,

## 1969 අංක 16 දරන පනතේ හා 1981 අංක 27 දරන ඉඩම් සංවර්ධන (සංශෝධිත) පනතින් ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රයට ඇතුලත් ඉඩම/ඉඩමෙන් කොටසක් රජයට භාරදීම.

........................................ පළාත් සභාවේ ........................................ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ........................................................................ ලිපිනයේ පදිංචි ................................................

වන මම 1969 අංක 16 දරණ පනතින් හා 1981 අංක 27 දරණ ඉඩම් සංවර්ධන (සංශෝධිත) පනතින් සංශෝධිත (464 වන අධිකාරිය වූ) ඉඩම් සංවර්ධන ආඥා පනතේ විධි විධාන වලට අනුකූලව නිකුත් කරන ලද පහත උපලේඛනයේ විස්තර කෙරෙන අංක ........................... දරණ ප්‍රදාන පත්‍රයේ ප්‍රදානලාභී ........................................................................ ලෙස එකී ප්‍රදානය කරන ලද මා වෙත ලැබුන සම්පූර්ණ ඉඩම / ඉඩමෙන් කොටසක් සඳහා මගේ සියලුම අයිතිවාසිකම්, පොල්මාකාර අයිතිවාසිකම් අද දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට පෙරලා ආපසු භාර දෙමි.

.....................................

ප්‍රදාන කරුගේ අත්සන

ඉහත කී ප්‍රදාන පත්‍රය අද දින ආපසු භාර ගනිමි.

.....................................

ප්‍රා.ලේ / නිඉකො / සඉකො (අන්තර් පළාත්) අත්සන

එකී ඉඩමේ උප ලේඛනය

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

| ප්‍රදාන පත්‍ර අංකය | පෙර ලියාපදිංචි අංකය | ලියාපදිංචි කළ දිනය |
|---|---|---|
| .............................. | .............................. | .............................. |